**ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2022**

-----------------------------------------------------------------------------------

ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 නොවැම්බර් 06 දින එළඹි අංක 5685 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II උපලේඛනයේ II ඡේදයේ (ඇ) (3) හා 2010 ජූලි 31 දින එළඹි ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලසීමාව

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන අමාත්‍යාංශය සහ වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෝරාගත් දිස්ත්‍රික්කවල නල ජල සේවා හා වැඩිදියුණු කළ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම සහ සම්බන්ධිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. නාගරික, ග්‍රාමීය හා වතු ජල සම්පාදන හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම පුනුරුත්ථාපනය කිරීම හා පුළුල් කිරීම, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවේ ධාරිතාවය ශක්තිමත් කිරීම, පුහුණුව ලබාදීම මඟින් ආංශික ධාරිතාවය ගොඩ නැංවීම හා ජලයේ ගුණත්වය සැලසුම්කරණය සහ ව්‍යාපෘති කළමනාකරණය හා පරිපාලනය යන සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,590 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 183.90 ක් වන අතර ඉන් රු.මිලියන 24,750 කට සමාන එ.ජ.ඩො මිලියන 165 ක් මූල්‍යනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 2,840 ක් ශ්‍රී ලංකා රජය හා ප්‍රජා දායකත්වය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2015 දෙසැම්බර් 07 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.
කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2 ඡේදයේහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය ශේෂය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය ශේෂය අතර රු. මිලියන 112 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර වෙනස තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ලැබී නොතිබුණි. | 112.00 | ලබාගත් ණය මුදලේ වටිනාකම අප විසින් මහ බැංකු ප්‍රකාශනයෙන් ලබාගෙන ඇති අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව එය මාසික සාමාන්‍ය අනුපාතයට අනුව ගිණුම්වලට ගෙන ඇත.<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය, ලං.ගි.ප්‍ර.21 ට අනුව, ලෝක බැංකු ණය හඳුනාගැනීමේදී දෙසැම්බර් මාසයේ සාමාන්‍ය අනුපාතය ගත යුතුය. | ණය අගය කිරීමේදී සමාන විනිමය අනුපාතිකයක් භාවිතා කිරීම සහ වසර අවසානයේදී වෙනස්කම් සැසඳිය යුතුය. |
| (ආ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව ව්‍යාපෘතියට ලබා ගත් ණය සඳහා පොලී වශයෙන් දැරූ එ.ජ.ඩො 10,232,420 කට සමාන රු. මිලියන 2,796.70 ක මුදලින් රු. මිලියන 179.64 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයේදී මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී ණය සඳහා සේවා ගාස්තුව වශයෙන් ණය දෙන ආයතනය විසින් අය කරන ලද එ.ජ.ඩො 2,915,309.40 කට සමාන රු. මිලියන 539.56 ක මුදලක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. එබැවින්, 2022 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ශේෂය රු. මිලියන 3,156.62 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 3,156.62 | මෙම ප්‍රතිපත්තිය 2018 වර්ෂයේ සිට භාණ්ඩාගාරය විසින් අත්හිටුවා ඇති අතර අපගේ භාණ්ඩාගාර වැය විෂය වාර්තාවල භාණ්ඩාගාරය විසින් රජයේ වියදම් ලෙස හඳුනාගෙන ඇති බැවින් එය නොපෙන්වයි. | ව්‍යාපෘති කාල සීමාව තුළ දරන ලද පොලී සහ බැඳීම් ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කළ යුතුය. |
| (ඇ) | 2016 වර්ෂයේදී අය කරන ලද රු. මිලියන 110 ක පොලිය සඳහා කරන ලද නිවැරදි කිරීම පෙර වර්ෂ ගැලපීම් ලෙස ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ණය ශේෂයට ගලපා තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක ණය ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 110.00 | 2023 වසර තුළදී මෙම වැරැද්ද නිවැරදි කිරීමට අප වග බලා ගනු ඇත. | පූර්ව කාල පරිච්ඡේද සඳහා වැරදි නිවැරදි කිරීම් සිදු කරන විට, එය පෙර වර්ෂ ගැලපීම් ලෙස ගැලපිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | කිලිනොච්චිය සහ රත්නපුර දිස්ත්‍රික්කවල අසම්පූර්ණ නාගරික ව්‍යාපෘති දෙකක් යටතේ සම්පූර්ණ කර ඇති ක්‍රියාකාරකම්වල සමස්ත වටිනාකම වූ රු. මිලියන 29 ක් කෙරීගෙන යන වැඩ ලෙස හඳුනා ගැනීම වෙනුවට එහි මූල්‍ය ප්‍රකාශනවල අවසන් කළ වැඩ ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, කෙරීගෙන යන වැඩ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 29.00 | රත්නපුර නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයේ මුළු පිරිවැය රු. 23,534,172.95 ක් වන අතර මෙම මුදල අවසන් කරන ලද පඹහින්න උප ව්‍යාපෘති පිරිවැය ලෙස සම්පූර්ණයෙන් හඳුනාගෙන නොමැත.<br><br>කිලිනොච්චි නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයේ මුළු පිරිවැය රු. 5,474,181.68 ක් වන අතර එය භූගත ජල මූලාශ්‍රයේ තක්සේරු පිරිවැයෙන් සහ මුලන්කාවිල් නා.ජ.ස.ක්‍ර. හි අධීක්ෂණ ගාස්තුවෙන් සමන්විත වේ. ඉහත සඳහන් දේ කොන්ත්‍රාත්කරුගේ කෙරීගෙන යන වැඩවලට අදාළ නොවන බැවින් අනෙකුත් ආයතනවල ගෙවීම් ඉහත ගිණුමට ගනු ලැබේ, එබැවින්, මෙය 2018 වර්ෂයේදී කිලිනොච්චියේ නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයේ පෙන්වා ඇත. | උප ක්‍රියාකාරකම්වලට අදාළ සියලුම පිරිවැය ප්‍රධාන ව්‍යාපෘතිය යටතේ ප්‍රාග්ධනීකරණය කළ යුතුය. |

## 2.2 නිරවුල් නොකළ ශේෂ

| අංකය | විස්තරය | වටිනාකම රු. මිලියන | නිරවුල් නොකළ කාල පරිච්ඡේදය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්කරුගෙන් රඳවා ගැනීම් | 233.625 | වසර තුනකට වැඩි | කොන්ත්‍රාත්කරු තවමත් රඳවා ගත් මුදල් ඉල්ලා නැත. අපි කොන්ත්‍රාත්කරුට දන්වා ඇති අතර රඳවා ගැනීම් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.<br><br>සමහර කොන්ත්‍රාත්තුවලට අදාළ රඳවා ගැනීම් නිදහස් කර ඇති අතර අනෙකුත් රඳවා ගැනීම් වර්ෂය තුළදී නිදහස් කරනු ලැබේ. | කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් කොන්දේසි අනුව කොන්ත්‍රාත්කරුගේ රඳවා ගැනීම් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බාහිර ආයතනවල තබා ඇති කෙටිකාලීන තැන්පතු | 69.245 | වසර තුනකට වැඩි | 2016/2017 වර්ෂවල තබා ඇති තැන්පතු මුදල වූ රු. 21, 767, 852.94 ක් 2023 වර්ෂය තුළදී අප විසින් නිරවුල් කර ඇත. | කාර්යය අවසන් වූ පසු කෙටි කාලීන තැන්පතු නිරවුල් කිරීමට වග බලා ගැනීම. |

උප ව්‍යාපෘති දෝෂ වගකීම් කාලය ආවරණය වූ පසු වසර 3 කට වැඩි කාලයක් තිස්සේ මාර්ග සංවර්ධන අධිකාරියේ තබා ඇති කෙටි කාලීන තැන්පතු නිදහස් කරනු ලැබේ.

## 2.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) වගන්ති අංක 7.7.2 | සමීක්ෂණ මණ්ඩල වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. මිලියන 2 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම හැත්තෑ තුනක් හානි වී ඇත. කෙසේ වෙතත්, 2023 මැයි 31 දින දක්වා මූල්‍ය රෙගුලාසි වගන්ති අංක 7.7.2 අනුව ඉහත වත්කම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 සැප්තැම්බර් 30 වැනි දිනට පෙර අපහරණය කර හැකි වත්කම් වාර්තා සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට අපි වග බලා ගනු ඇත. | මුදල් රෙගුලාසිවලට අනුව මෙම කාරණය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | (ii) වගන්ති අංක 170 (3) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසිවල වගන්තිය අංක 170 (3) ප්‍රකාරව 2022 මැයි 31 දින වන විටත් සමාලෝචිත වර්ෂයේදී සහ ඊට පෙර වර්ෂය තුළදී කොන්ත්‍රාත්කරුවන් 3 දෙනෙකුගෙන් අඩු කරන ලද රු. මිලියන 7.493 ක ඇවර කළ අලාභ ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | අපි 2023 ජූනි මාසය තුළදී රු. මිලියන 4.7 ක ඇවර කළ අලාභ ජල සම්පාදන අමාත්‍යාංශය වෙත යවා ඇති අතර මේ දක්වා ව්‍යාපෘති 2 ක් පමණක් නිම කර ඇති බැවින් ව්‍යාපෘති 3 න් ව්‍යාපෘති 2 කට අදාළ ඇවර කළ අලාභ මෙම මුදලෙහි අඩංගු වේ. | මූල්‍ය රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| | (iii) වගන්ති අංක 245 සහ 257 | නියදි පරීක්ෂණයට අනුව ගෙවීම් වවුචර 6 ක් සඳහා රු. මිලියන 58 කට සමාන මුදලක් සහතික කිරීමකින් තොරව ගෙවා ඇති බවත් ගෙවීම් වවුචර | අපි එය නියමිත වේලාවට එවනු ලැබේ. | ගෙවීම් කරන අවස්ථාවේදී වවුචර් අත්සන් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 10 කින් රු. මිලියන 14 ක් අනුමත කිරීමකින් තොරව ගෙවා ඇති බවත් නිරීක්ෂණය විය. | | |
| (ආ) | යෝජනා සඳහා ඉල්ලීමේහි පොදු කොන්දේසිවල කොන්දේසි අංක 24.1 (02) | කොන්ත්‍රාත්තුවේ කොන්දේසිය අනුව උපදේශන සේවය ආරම්භ කිරීමට පෙර රක්ෂණ ආවරණය ලබා ගැනීම වෙනුවට ග්‍රීන්ටෙක් බද්ධ ව්‍යාපාරය විසින් උපදේශන සේවාව ආරම්භ කිරීමෙන් පසු රක්ෂණ ආවරණය ලබාගෙන තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ දිනය 2016.10.28 විය. ඒ අනුව උපදේශකයා විසින් පී II මාස 2 ක සුළු ප්‍රමාදයකින් ලබා දී ඇත. මහජන වගකීම් රක්ෂණය ද 2017.01.04 දින සිට ලබා ගෙන ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘති කටයුතුවල භෞතික ප්‍රගතිය

නාගරික හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම, පුනරුත්ථාපන ව්‍යාපෘති, පොදු සනීපාරක්ෂක, දේශීය සනීපාරක්ෂක හා පාසල් සනීපාරක්ෂක ව්‍යාපෘති සම්බන්ධ ව්‍යාපෘති 35ක ව්‍යාපෘති කාලසීමාව නිසි ලෙස සැලසුම් නොකිරීම, කොන්ත්‍රාත්කරුවන් කිහිප දෙනෙකුගෙන් දුර්වල ක්‍රියාකාරිත්වය, ආනයන සීමා කිරීම්, ප්‍රජා විරෝධතා, පාරිසරික සහ නැවත පදිංචි කිරීමේ ගැටළු යනාදිය හේතුවෙන් අවස්ථා 01 සිට 08 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම් ලබා දී ඇති අතර ඒ අනුව දින 60 සිට දින 1,800 ක් දක්වා සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. එබැවින්, ඉහත හඳුනාගත් ගැටළු මඟහරවා ගැනීමට සහ මෙම ව්‍යාපෘතිය පිළිබඳ දැඩි අධීක්ෂණයක් පවත්වා ගැනීමට කළමනාකාරීත්වය විසින් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නොගතහොත් දීර්ඝ කරන ලද කාලසීමාව තුළ ව්‍යාපෘතිය නිම නොකිරීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ජල සම්පාදන ව්‍යාපෘති හතක නිරත කොන්ත්‍රාත්කරුවන්ට මුල් කොන්ත්‍රාත්තු කාලය ඉක්මවමින් එකම ව්‍යාපෘතිය සඳහා අවස්ථා තුනේ සිට අට දක්වා දීර්ඝ කිරීම් ලබා දී තිබූ අතර රු. මිලියන 113.39 ක බලමුලු ගැන්වීමේ අත්තිකාරම් අවුරුදු දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ ඔවුන් ළඟ තබා ගැනීමට කොන්ත්‍රාත්කරුවන්ට ඉඩ ලබා දී තිබුණි. | දියතලාව කොන්ත්‍රාත්තුව අවසන් කරන ලද අතර අත්තිකාරම් සහ කාර්ය සාධන බැඳුම්කරය සම්පූර්ණයෙන්ම අය කර ගෙන ඇත. එබැවින්, අයකර ගත යුතු අත්තිකාරම් නොමැත. කොන්ත්‍රාත් කොන්දේසි අනුව අනෙකුත් කොන්ත්‍රාත් අත්තිකාරම් අඩු කර ගෙන ඇත. අයකර ගත යුතු කොන්ත්‍රාත් අත්තිකාරම් සඳහා, අත්තිකාරම් බැඳුම්කර ව්‍යාපෘති කළමනාකරණ අංශයේ ගිණුම් අංශයේ ඇත. | නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘති අවසන් කිරීම සඳහා දිස්ත්‍රික් කළමණාකරුවන් විසින් ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කළ යුතු අතර කාලය දීර්ඝ කිරීම වෙනුවට දුර්වල ලෙස ක්‍රියා කරන කොන්ත්‍රාත්කරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු අඩු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නව කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේදී දැනටමත් ව්‍යාපෘති ලබාදී ඇති දුර්වල ක්‍රියාකාරී කොන්ත්‍රාත්කරුවන්ගේ පවත්නා කාර්ය සාධනය මත ඇගයීමට ලක් කර නොමැති බව නිරීක්ෂණය විය. එම නිසා, දැනට ලබා දී ඇති කොන්ත්‍රාත් සම්බන්ධව දුර්වල ලෙස ක්‍රියා කර ඇති කොන්ත්‍රාත්කරුවන් දෙකකට ව්‍යාපෘති හතක් ප්‍රදානය කර තිබුණු අතර රු. මිලියන 52.57 ක අත්තිකාරම් මුදලක් ඵලදායී ලෙස යොදා නොගෙන ඔවුන් ළඟ තබාගෙන තිබුණි. | මෙම අවස්ථාවේදී, ඔරුබැඳිවැව II අදියර සහ III අදියර කොන්ත්‍රාත්තුවේ ප්‍රධාන නල එලීමේ කටයුතු සහ විද්‍යුත් යාන්ත්‍රික කටයුතු අවසන් කර ඇත. උල්හිටිය තුළුමුවෙන් එකෙන් ජල පවිත්‍රාගාරයට වතුර පොම්ප කරමින් ඇත. සෝදා හැරීමේ සහ විෂබීජ නාශක කටයුතු සිදු කරමින් පවතී. නිවාසවලට සම්බන්ධතාවය ලබා දීම සිදු කළ යුතුව ඇත. | නව කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට පෙර දැනට සිටින කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති කාලසීමාව තුළ දිස්ත්‍රික්ක 07 ක ඉදිකිරීමට නියමිතව තිබූ වැසිකිළි 24,000 න් දෙවන ව්‍යාපෘති දිගුව 2023 දෙසැම්බර් 31 දින අවසන් වීමට නියමිතව තිබියදී සමාලෝචිත වර්ෂය අවසානයේදී වැසිකිළි 21,862 ක් හෙවත් සියයට 91 ක් පමණක් නිම කර ඇති බව නිරීක්ෂණය විය. | මේ වන විට සියයට 85 ක් අවසන් කර ඇත. සැලසුම් කළ සනීපාරක්‍ෂක ඉලක්කය සංශෝධනය කිරීම නිසා සමහර ප්‍රතිලාභීන් ක්‍රියාත්මක වන සනීපාරක්ෂක වැඩසටහනෙන් ඉල්ලා අස් වේ. | අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම සඳහා අත් කරගත හැකි ඉලක්කයක් මූලික අදියරේදීම ස්ථාපිත කළ යුතුය. |
| (ඈ) | ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරී සැලැස්මට අනුව කෑගල්ල, මොණරාගල සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල රු. 250,000 ක් බැගින් වූ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රතිලාභීන්ගේ සනීපාරක්ෂක ඒකක 84 ක් ඉදිකිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කෑගල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල පමණක් ඒකක 48 ක් හෙවත් සියයට 57 ක් ඉදිකර තිබුණු අතර කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි. | ක්‍රියාත්මක කිරීමේ අදියරෙහිදී, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුබසාධන අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ බලධාරීන් විසින් හඳුනාගෙන ඇති ආබාධිත පුද්ගලයින් සඳහා වැසිකිළි 36 ක් සැපයීම, ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වීමට හේතුව වේ. | අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම සඳහා අත්කර ගත හැකි ඉලක්කයක් මූලික අදියරේදීම ස්ථාපිත කළ යුතු අතර නියමිත වැඩකටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී උපදේශන සේවා සඳහා රු. මිලියන 961.14 කට සමාන මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සිදු කරන ලද නියදි භෞතික විගණනවලට අනුව, කොන්ත්‍රාත් දුර්වල ලෙස නිරීක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම හේතුවෙන් ව්‍යාපෘති අවසන් කිරීම, ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම, විචලනයන් අනුමත කිරීම, අමතර වැඩ අනුමත කිරීම, නිල නිවාස ඉදිකිරීම් නැවත සැලසුම් කිරීම යනාදිය අඛණ්ඩව සිදු වූ බව නිරීක්ෂණය විය. | අයි.එස්.සී උපදේශක තෝරා ගැනීම සඳහා ගුණාත්මකභාවය සහ පිරිවැය පදනම් කරගත් තේරීම් ක්‍රමයක් යොදා ගන්නා ලදී. | දුර්වලතා මඟහරවා ගැනීම සඳහා උපදේශකයා සමඟ කළමනාකාරිත්වය ශක්තිමත් එකඟතාවකට පැමිණිය යුතු අතර උපදේශකයින්ගේ දුර්වල කාර්ය සාධනයට එරෙහිව පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | දුර්වල නඩත්තුව හේතුවෙන් 2023 ජූනි 05 දිනට වෙබ් අඩවිය ක්‍රියාකාරී නොවීම නිසා ව්‍යාපෘතිය සඳහා වෙබ් අඩවිය සංවර්ධනය කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය. | ප්‍ර.මු.ස නිරීක්ෂණ වෙබ් අඩවිය ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අරමුදල් යටතේ සංවර්ධනය කර ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී. | ව්‍යාපෘති කාල සීමාව අවසන් වන තෙක් ව්‍යාපෘතියෙන් සංවර්ධනය කරන ලද වත්කම් නිරීක්ෂණය කිරීම. |
| (උ) | 2022 නොවැම්බර් 26 දිනැති අංක 22/1636/611/015 දරන තීරණය යටතේ මහා භාණ්ඩාගාරයට කිසිදු අමතර වැය බරක් නොමැතිව ජාත්‍යන්තර ජල සමුළුව සඳහා සත්කාරත්වය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණද, සම්මන්ත්‍රණය සඳහා ආහාර සැපයීම වෙනුවෙන් වැය කළ රු. මිලියන 9.5 ක් ආයතනික ධාරිතා සංවර්ධන සංරචකය යටතේ ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් වැය කර තිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන 4.4 ක් (එ.ජ.ඩො 12,000 ක්) වටිනා දිවා ආහාර 100 ක් ලබා දීමට පමණක් ලෝක බැංකුවේ අනුමැතිය ලබා ගෙන තිබුණද ව්‍යාපෘතිය විසින් දිවා ආහාර 1,350 ක් සඳහා රු.මිලියන 9.5 ක් වැය කර තිබුණි. අවසානයේදී, රටේ ආර්ථික අර්බුදයක් තිබියදී මහා භාණ්ඩාගාරයට මේ මුදල වැය බරක් වී තිබුණු අතර එය ණය වටිනාකමට ඇතුළත් කර තිබුණි. | මෙම ගෙවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදී. | ව්‍යාපෘතියේ අරමුදල් ව්‍යාපෘති කටයුතු සඳහා පමණක් යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | දත්ත අධීක්ෂණය සහ ඇගයීම සඳහා වන වෙබ් පාදක ක්ලවුඩ් සේවාදායක පද්ධතිය සංවර්ධනය කර 2020 ජනවාරි 16 වන දින ජාතික ප්‍රජා හා ජල සම්පාදන දෙපාර්තමේන්තුවට භාර දී තිබුණද, ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීමේ සංරචකය යටතේ සංවර්ධනය කරන ලද පද්ධතිය නඩත්තු කිරීමට ව්‍යාපෘතිය විසින් වැඩිදියුණු කරන ලද ක්ලවුඩ් සේවාදායක පද්ධති කළමනාකරණ සේවාවන් කුලියට ගෙන තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 8 ක් වැය කර තිබුණි. | ඉහත අධීක්‍ෂණ සහ ඇගයීම් පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා උපදේශන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. පාර්ශවකරුවන් (ඩී.එන්.සී.ඩබ්ලිව්.එස්/එන්.ඩබ්ලිව්.එස්.ඩී.බී/පී.එච්.ඩී.ටී ආදි) සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර ඔවුන්ගේ අදහස් වෙබ් අඩවියේ සංවර්ධන අදියරේදී සලකා බලන ලදී. භාර දීමෙන් පසු, ජා.ප්‍ර.ජ.සැ.දෙ. වෙතින් මෙම වෙබ් අඩවිය සඳහා අමතර පහසුකම් ඉල්ලා සිටී. අධීක්‍ෂණ සහ ඇගයීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී දත්ත සමුදායක් ලෙස තබා ගැනීමට අමතර පහසුකම් ඔවුන්ගෙන් ඉල්ලා ඇත. එබැවින්, වෙබ් පාදක අධීක්‍ෂණ සහ ඇගයීම් පද්ධතියට අමතර පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් තනි පුද්ගල උපදේශකයෙකුගෙන් සේවාව ලබා ගනී. | පද්ධතියේ අවශ්‍යතා මූලික අදියරේදී තීරණය කළ යුතු අතර සංවර්ධන කාලය තුළ ක්‍රියාකාරකම් සමීපව නිරීක්ෂණය කළ යුතුය. අකාර්යක්ෂමතාව නිසා පාඩුවක් සිදුවී ඇත්නම් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (එ) | අධිකරණ වාරණ නියෝගය මත ඉදිකිරීම් කටයුතු තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් උඩුබද්දධන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 27 දින අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන 38.25 ක මිල ඉහළ නැංවීමක් ඇතුළුව රු. මිලියන 104.41 ක පිරිවැයකට එම කොන්ත්‍රාත්තුව නව කොන්ත්‍රාත්කරු වෙත නැවත ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තුව අවසන් කරන විට භෞතික ප්‍රගතිය සියයට 52 ක් වූ අතර නව කොන්ත්‍රාත්තුව 2021 නොවැම්බර් 15 දින ප්‍රදානය කර තිබුණි. එය 2022 ජූලි 18 වැනි දින සම්පූර්ණ කිරීමට නියමිත වේ. කෙසේ වෙතත්, මතුපිට ජලය ලබාගැනීමේ ඉදිකිරීම් නැවැත්වීමට ප්‍රජාවෙන් දිගින් දිගටම විරෝධය එල්ල වීම හේතුවෙන්, නව කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය, 2023 ජූලි 24 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමෙන් පසු 2023 අප්‍රේල් මස අවසන් වන විටත් සියයට 80 ක මට්ටමක පැවතුණි. ඒ අනුව, ව්‍යාපෘතිය මඟින් ප්‍රජාවගේ විරෝධය හඳුනා ගැනීම සඳහා මූලික අදියරේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. | ජල මූලාශ්‍රය හේතුවෙන් උඩුබද්දධන කොන්ත්‍රාත්තුව අන්‍යොන්‍ය වශයෙන් අවසන් විය. ජල මූලාශ්‍ර ප්‍රශ්න අධිකරණයේදී අවධානයට ලක් විය. අධිකරණ වාරණ නියෝගය අනුව ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවත්වා ඇත. | ශක්‍යතා අධ්‍යයනයකින් තොරව වැඩ ආරම්භ කර ඇති බැවින් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීමට කළමනාකරණය වගකිව යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අපේක්ෂිත අවසන් කිරීමේ දිනය 2020 දෙසැම්බර් 31 වුවද, එය 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, 2020 වසරේ සිට මහා භාණ්ඩාගාරය විසින් එ.ජ.ඩො මිලියන 13 ට සමාන රු. මිලියන 3,462 ක ණය ආපසු ගෙවීම් සිදු කර තිබුණි. ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල ප්‍රමාදය සහ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් අපේක්ෂිත අරමුණු සපුරා ගැනීමකින් තොරව ණය ආපසු ගෙවීමට සිදු විය. | කොවිඩ්-19 වසංගතය වැනි රටෙහි සහ ලෝකයේ සිදු වූ වෙනස්කම් සහ රටෙහි ආර්ථික අර්බුදය මත ව්‍යාපෘති කාලය දීර්ඝ කරන ලදී. ණය ගිවිසුම මත ණය ආපසු ගෙවීම සිදු කරන අතර ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කිරීම සහ ණය ආපසු ගෙවීම අතර සහ සම්බන්ධතාවයක් නොමැත. නමුත් මුල් ව්‍යාපෘතිය සහ අතිරේක මූල්‍යකරණය සඳහා ව්‍යාපෘති කාල සීමාවේ දිගුවක් ලබා දී ඇත. | ණය කාලය දීර්ඝ කිරීම සඳහා ලබා දී ඇති දිගුව අනුව ණය ආපසු ගෙවීම සඳහා දිගුවක් ලබා ගැනීම සඳහා ණය දෙන ආයතනය සමඟ සාකච්ඡාවක් කිරීමට අවශ්‍ය වේ. සැලසුම් කර ඇති පරිදි ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට වග බලා ගැනීම. |

## 3.3 වාරක පරීක්ෂණ නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මොණරාගල සෙප්ටේජ් පවිත්‍රාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2021 ඔක්තෝම්බර් 19 වන දින නිම කිරීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා වැය වන මුදල රු. මිලියන 67 කි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් රු. මිලියන 9.4 ක් වැය කරමින් සියයට 45 ප්‍රගතියක් ළඟා කර ගැනීමෙන් අනතුරුව කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර තිබුණි. තවද, ඉතිරි වැඩ සඳහා කැඳවන ලද ලංසු තවමත් ඇගයීම් මට්ටමේ පවතී. කොන්ත්‍රාත්තුවේ කටයුතු ආරම්භයේදී ඉදි කළ යුතු වැටක් නොමැතිවීම හේතුවෙන් ඉදිකිරීම්වලට බාධා කරමින් පළාත් පාලන ආයතන විසින් ඉඩමට කසළ බැහැර කර තිබුණි. | ප්‍රාදේශීය සභාව විසින් දිගින් දිගටම කසළ බැහැර කිරීම හේතුවෙන් සෙප්ටේජ් පවිත්‍රාගාරය ඉදිකිරීමට ඉඩම සකස් කිරීම සඳහා කසළ ඉවත් කිරීමට කොන්ත්‍රාත්කරු සැහෙන කාලයක් ගත කර ඇත. පළමු කොන්ත්‍රාත්තුව ලබා දීමට පෙර කසළ බැහැර කිරීමේ ගැටලුව ඇති විය. | කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේදී අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මොණරාගල දිස්ත්‍රික්කයේ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා සැලසුම් කර ඇති සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීමේ කටයුතු 2021 අප්‍රේල් 30 වන දින රු. මිලියන 18.37 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණු අතර 2021 ඔක්තෝම්බර් 30 දිනට වැඩ අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, 2022 අගෝස්තු 31 දක්වා කාලය දීර්ඝ කර තිබියදී පවා සැලසුම් කර තිබූ පහසුකම් 35 න් රු. මිලියන 10.8 ක් වටිනා පහසුකම් 14 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. | නැවත වෙන්කර දීමෙන් පසු ක්‍රියාත්මක කරන වැඩසටහනට ආබාධිත පුද්ගලයන් සඳහා සනීපාරක්ෂක පහසුකම් අවශ්‍ය වේ. මූලික ඉලක්කය 84 කි. මේ දක්වා විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා වන සනීපාරක්ෂක පහසුකම් 48 ක් සපයා ඇත. ආබාධිත සනීපාරක්ෂක වැඩසටහන අවසන් කර ඇත. | ව්‍යාපෘතියේ මූලික අදියරේදී අවශ්‍යතාවය තක්සේරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රතුගල ආදිවාසීන් සඳහා සැලසුම් කර ඇති වැසිකිලි 92 ක් ඉදිකිරීමේ කටයුතු 2021 පෙබරවාරි 12 වන දින රු. මිලියන 14.8 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණු අතර 2021 අගෝස්තු 12 දිනට වැඩ අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, 2022 අගෝස්තු 31 දක්වා වසරකින් කාලය දීර්ඝ කර තිබියදී පවා භෞතික සත්‍යාපන දිනය වූ 2022 නොවැම්බර් 25 දින වන විට කිසිදු පහසුකමක් නිම කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ව්‍යාපෘතියේ මූලික අදියරේදී අවශ්‍යතාවය තක්සේරු කළ යුතුය. |
| (ඈ) | මහගම පුනරුත්ථාපන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 දෙසැම්බර් 18 වන දින රු. මිලියන 53.2 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණු අතර 2021 දෙසැම්බර් 17 දිනට වැඩ අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් 2023 ජූලි 09 දක්වා දෙවරක් කාලය දීර්ඝ කර තිබියදී පවා භෞතික සත්‍යාපන දිනය වූ 2022 නොවැම්බර් 25 දින වන විට සියයට 65 ක ප්‍රගතියක් පමණක් ළඟා කර ගෙන තිබුණි. | දැන් නිම කිරීමේ අදියරේ පවතී. | අපේක්ෂිත කාල සීමාව තුළ කොන්ත්‍රාත් වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පීලකඳුර ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාළව ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017 නොවැම්බර් 27 වැනි දින රු. මිලියන 127.03 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණු අතර 2018 නොවැම්බර් 27 දිනට වැඩ අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය දිර්ඝ කිරීම් 08 ක් යටතේ සහ වසර හතරක කාල ප්‍රමාදයක් සහිතව කොන්ත්‍රාත්තුව 2022 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය සහ මහජන විරෝධතා ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීමට බලපා තිබුණි. තවද, ප්‍රමාණ බිල්පතට අනුව ඩී.අයි පයිප්ප, ජී.අයි පයිප්ප සහ උපාංග සපයා නොතිබුණද, ව්‍යාපෘතිය විසින් එම අයිතම අතුරා තිබුණි. එම නල සහ උපාංග ප්‍රමාණ බිල්පතට අනුව අවශ්‍ය ප්‍රමිතියෙන් සැපයීම තහවුරු කිරීමට සාක්ෂි නොතිබුණි. | ජල සම්පාදන යෝජනා ක්‍රමය අර්ධ වශයෙන් ක්‍රියාත්මක වේ. නිවාස සම්බන්ධතා 600 කින් නිවාස 360 කට ජලය ලැබේ. | අපේක්ෂිත කාල සීමාව තුළ කොන්ත්‍රාත් වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2019 ට පටහැනිව කොන්ත්‍රාත් ගිවිසුම යටතේ ව්‍යාපෘතිය විසින් සේවකයින් 108 ක් යොදවා තිබුණි. එයින් 05 දෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකළ ප්‍රමාණ සමීක්ෂක සහ කෙටුම්පත් කරුවන් වැනි තනතුරු 07 ක් සඳහා යොදවා තිබුණි. | ප්‍රමාණ සමීක්ෂක, කෙටුම්පත් කරුවන් වැනි සමහර තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ලැයිස්තුවේ නොතිබුණි. නමුත් ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල අවශ්‍යතාවය අනුව, ව්‍යාපෘතිය විසින් කෙටි කාලීන සේවා කොන්ත්‍රාත් මත සේවය ලබා ගෙන ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛවල විධිවිධාන දැඩිව පිළිපැදීම. |
| (ආ) | ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා 2020 නොවැම්බර් 05 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර උතුර) ලෙස උසස් කර තිබුණි. නමුත්, 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2019 හි 2.3.2 වගන්තියට අනුව ඵලදායි ව්‍යාපෘති කළමනාකරණය සහතික කිරීම සඳහා ඔහු සෑම විටම පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. | පූර්ණ කාලීන පදනමින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු පත් කිරීමට කටයුතු කළ යුතුය. |